වයස අවුරුදු 11 ක බාලවයස්කාර දැරියක් ලිංගික අපයෝජනකට ලක් වූ බවට පැවසෙන පුවතක්, මාධ්‍ය තුළ පුළුල්ව ආවරණය වී තිබිණි. එම පුවත වාර්තා කරනා ජනවාරි 23, 2022, දිවයින ඉරිදා සංග්‍රහය එය දක්වා ඇත්තේ, "ටික් ටොක් ඇප් එකෙන් 'ටිප් ටොප්' ගේමක් දුන් ටික් ටොක් කිරි සමන්" යන සිරස්තලයෙනි. "ටික් ටොක් වල තවත් අපරාධයක්", "පාසල් සිසුවියක් කෙළෙසයි", හා "සිසුවියට වයස 11 යි" යන උපසිරස්තලයන් ද එහි දක්නට ලැබිණි. මීට අමතරව, මෙම ලිපිය තුළ අදාළ බාලවයස්කාරියගේ අනන්‍යතාවයද හෙළිදරව් කර තිබිණි.

ඔබ සිතනා ආකාරයට,

1) ලිංගික අපයෝජනයකට ලක්වුණු බාලවයස්කරුවෙකුගේ අනන්‍යතාවය හෙළි කිරීම ඔස්සේ ,ලිංගික අපයෝජනයට මුහුණ පෑ අයට නැවත වතාවක් සමාජ ගර්හාවකට හා කොන් කිරීමකට මුහුණ දීමට සිදු නොවනු ඇතිද? එසේම, එම බාලවයස්කරුවා හට සිය පාසල් අධ්‍යාපනය නිසි ලෙස සම්පූර්ණ කරගැනීමට පවා බාධා එල්ල නොවනු ඇතැයි සහතික විය හැකිද?

2) "ටික් ටොක් ඇප් එකෙන් 'ටිප් ටොප්' ගේමක් දුන් ටික් ටොක් කිරි සමන්" යන සිරස්තලය, ලිංගික අපයෝජනයක් ඉදිරිපත් කිරීම සඳහා කෙතරම් යෝග්‍ය යැයි ඔබ සිතන්නේ ද? ඒ ඔස්සේ ලිංගික අපයෝජනයක බරපතළ භාවය පිළිබිඹු වනු ඇතැයි ඔබ සිතන්නේ ද?

3) ලිංගික අපයෝජනයකට මුහුණ දුන් අයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය කෙරෙනා "කෙළෙසීම" වැනි යෙදුමක් වෙනුවට, "ලිංගික අපයෝජනය" යන්න වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

4) "කථනාබාධිත" යන යෙදුමට වඩා, පුද්ගලයා මූලික කොට දැක්වෙන "කථන ආබාධයක් සහිත" වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?